කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOME 1054 - ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. " අර්පනය " යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 04)

ආ. අර්පනයක් අවසාන වන ක්‍රම මොනවාදැයි විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 16)

(මුළු ලකුණු 20)

02. අ. " අගනා ප්‍රතිඥාව " යන්න නිර්වචනය කර ප්‍රතිඥාවක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් හිංසාවට පත් පාර්ශවයට ඇති ප්‍රතිකර්ම මොනවා දැයි විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. අ " අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය " ස්ථාපිත කිරීමට අවශ්‍ය කොන්දේසි මොනවාදැයි විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් දක්වන්න

(ලකුණු 10)

ආ නියෝජ්‍යත්ව සම්බන්ධතාවය අවසන් වන්නා වූ ආකාර කෙසේද ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. අ. භාණ්ඩ විකිණීමේ ගිවිසුම්ක කොන්දේසි සහ ප්‍රතිඥාභාර අතර ඇති වෙනස්කම් මොනවාද ?

(ලකුණු 08)

ආ. රසික, පරිගණකයක් කම්පියුටර් වර්ල්ඩ් පෞද්ගලික සමාගමෙන් මිලදී ගත් ඔහු එම පරිගණකය අදාල ආයතනයෙන් මිලදී ගන්නා අවස්ථාවේදී එහි සිටි වෙළඳ සේවකයාට පවසා සිටියේ සිය කටයුතු කර ගෙන යාම සඳහා අවම වශයෙන් 4GB ධාරිතාවයකින් යුත් පරිගණකයක් ඔහුට අවශ්‍ය බවයි. නමුත් පසුව ඔහුට දැන ගැනීමට ලැබුනේ මිලදී ගත් පරිගණකයේ ධාරිතාවය 2GB බවයි. දැන් රසිකට සමාගමට එරෙහිව අදාල පරිගණකය මිලදී ගැනීමේ පරමාර්ථයට සුදුසු නොවීම සහ වෙළඳ තත්වයේ නොපැවතිට යන කරුණු මත නඩු පැවරීමට අවශ්‍යව ඇත. අදාල පාර්ශවයන්ගේ නෛතිකමය තත්වය විස්තර කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

05. අ. හවුල් ව්‍යාපාරයක සිටිය හැකි විවිධ අන්දමේ හවුල්කරුවන් කවුරුන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. හවුල්කරුවෙකු සතු " ව්‍යාංග බලය " යනු කුමක්ද ?

(ලකුණු 04)

ඇ. හවුල්කරුවෙකු සතු ව්‍යාංග බලය පිළිබඳව ඇති සීමා කිරීම් මොනවාද ?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06. අ. ගණුදෙනු කළ හැකි ලියවිල්ලක තිබිය යුතු මූලික ලක්‍ෂණ මොනවාද ?

(ලකුණු 08)

ආ. පහත සඳහන් පිටසන් කිරීම් විස්තර කොට ඒවා එකිනෙකෙහි ප්‍රතිඵල දක්වන්න.

i. හිස් පිටසන

ii. විශේෂ පිටසන

iii. සීමාකාරි පිටසන

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

07. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

අ. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය

ආ. නීතියේ පරමාර්ථ

ඇ. ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍ර

ඉ. මූලික අයිතිවාසිකම්.

(ලකුණු 10x2= මුළු ලකුණු 20)